# Path to Success - Study Pack

## 2021 පළමු පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂනී කේ.පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ.පී.සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

**විෂය සම්බන්ධීකරණය**

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

**සැකසුම**

එච්.ඒ.එන්.වයි.චන්ද්‍රසේකර මිය

බප/කැල/ දුටුගැමුණු මහා විද්‍යාලය - පෑළියගොඩ

ජී.යූ.පී.පියසේකර මිය

බප/කැල/සිරි සිදුහත් කණිෂ්ට විද්‍යාලය

එම්.එල්.ඩබ්.පෙරේරා මෙනවිය

බප/කැල/නැලිගම සංඝමිත්තා විද්‍යාලය

සියලුම හිමිකම් ඇවිරිණි.

## 2021 - පළමු වාරය
## බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය
## 01 පාඩම - ගැටලු විසඳමු දැහැමි විලසින්



- වර්තමාන ලෝකයේ සෑම වයස් මට්ටමකම සෑම තරාතිරමකම අය තම ජීවන ගමනේ විවිධ ගැටලු සඳහා මුහුණදෙමින් සිටියි.
- කිසිඳු පාර්ශවයකට හානියක් නොවන අයුරින් අදාළ ගැටලු විසඳා ගැනීමට කටයුතු කළ යුතුය.
- ඒ සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉතා සාර්ථක පිළිවෙත අනුගමනය කිරීම වඩාත් සුදුසු ය.
- බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් තුළින් මතු වූ විවිධාකාර ගැටලු මෙන්ම ශාසනික වශයෙන් පොදුවේ මතු වූ ගැටලු සඳහා සුවිශේෂී ලෙස මැදිහත් වී සෑම පාර්ශවයකටම යහපත් වන අයුරින් විසඳුම් ලබා දුන්හ.
- එම පිළිවෙත එපරිද්දෙන්ම අපට අනුගමනය කළ නොහැකි නමුත් උන්වහන්සේ අනුගමනය කළ ක්‍රියා පිළිවෙත ආදර්ශයට ගෙන සෑමටම සුබවාදී විසඳුමක් ලැබෙන ලෙස ගැටලු විසඳා ගැනීමට අවස්ථාව සලසා ගත හැකිය.

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) සංඝ භේදයඇතිකිරීමේ අරමුණින් බුදුරදුන්ගෙන් වර පහක් ඉල්ලා සිටියේ,
   i. මහාපන්ථක තෙරුන් ය.
   ii. සුභද්‍ර තෙරුන් ය.
   iii. දේවදත්ත තෙරුන් ය.
   iv. චුල්ලතිස්ස තෙරුන් ය.

2) කාන්තාවන්ට පැවිද්ද ලබා දීම පිළිබඳව ගැටලුවේදී බුදුන් වහන්සේ ඉදිරිපත් කළේ,
   i. අෂ්ට ගරු ධර්මය.
   ii. පංච නීවරණ ධර්මය.
   iii. සප්ත අපරිහානීය ධර්මය.
   iv. දස පාරමිතා ධර්මය.

3) "ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර ....." මෙම කවිපද ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය වන්නේ,
   i. සුභාෂිතය ii. කාව්‍යශේඛරය iii. කව්සිළුමිණ iv. ගුත්තිල කාව්‍ය

4) කාන්තාවන්ට පැවිද්ද ලබා දීමේ දී ඉදිරිපත් වී කටයුතු කළේ,
   i. ආනන්ද හිමියන් ය.
   ii. සැරියුත් හිමියන් ය.
   iii. මුගලන් හිමියන් ය.
   iv. යසකුල හිමියන් ය.

5) බුදුන් වහන්සේ සුදු රෙදිකඩක් අතට දී "රජෝ හරණං රජෝ හරණං" යනුවෙන් කියමින් රෙදිකඩ පිරිමදින ලෙස උපදෙස් දුන්නේ,
   i. නන්ද හිමියන්ට ය.
   ii. මහාපන්ථක හිමියන්ට ය.
   iii. චුල්ලපන්ථක හිමියන්ට ය.
   iv. රේවත හිමියන්ට ය.

❖ හිස්තැන් පුරවන්න.


6) දිව්‍යාංගනාවක් ලබාගැනීමට නම් භාවනා කළයුතු යැයි බුදුන් වහන්සේ උපදෙස් ලබාදුන්නේ ..................................................... කුමාරයාට ය.
7) ශාක්‍ය හා කෝලිය වංශයේ පිරිසක් ........................................................... නදියේ ජලය බෙදා ගැනීමට යුධ වදින්නට සූදානම් විය.
8) පැවිද්ද අතහැර යාමට සිටි චූල්ලපන්ථක පොඩිහාමුදුරුවෝ ................................................ අවබෝධ කරගෙන රහත් විය.
9) දෙව්දත් තෙරුන් අවසානයේ තමන්ම .................................................... පර්වතයට නැගී ගලක් පෙරළීය.
10) නන්ද කුමරු නිවසින් පිටවෙද්දී "හිමියනි වහා එන්න" යයි ................................................ය කිව්වා ය.

❖ පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද වරහන තුළ යොදන්න.

11) බුද්ධ කාලීන භාරතය බ්‍රාහ්මණ ආධිපත්‍ය ප්‍රබලව තිබූ කාලයක් විය. (.........)
12) බුදුන්වහන්සේ කාන්තාවන්ට පැවිද්ද ලබාදෙනමෙන් ප්‍රජාපති ගෝතමිය කළ ඉල්ලීමට අවසර දුන්නේ දෙවන වරට ඇය ඉල්ලීම් කල පසුවයි. (.........)
13) බුද්ධ කාලීන බ්‍රාහ්මණ සමාජයේ කාන්තාවන්ට උරුම වී තිබුණේ කණගාටුදායක තත්වයකි. (.........)
14) බුදුන්වහන්සේ නන්ද හිමියන්ගේ සිත වෙනතකට යොමුකොට ගත්තේ දෙව්ලොව දෙවඟනන් පෙන්වමිනි. (.........)
15) චූල්ලපන්ථක හාමුදුරුවෝ අවසානයේ සිවුරු හැර පැවිදි ජීවිතයෙන් සමුගත්තේය. (.........)

❖ පිළිතුරු ලියන්න.

16) සිව්වනක් පිරිස නම් කරන්න.
17) අෂ්ඨ ගරු ධර්ම නම් කරන්න.
18) නන්ද කුමාරයාගේ මව හා පියා නම් කරන්න.
19) දෙව්දත් තෙරුන් ඉදිරිපත් කළ පංච වරය නම් කරන්න.
20) චූල්ලපන්ථක පොඩිහාමුදුරුවෝ මුල්කරගත් ගැටලුවේ දී බුදුන්වහන්සේ ක්‍රියාකළේ කෙසේද?



## 2021 - පළමු වාරය
## බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය
## 02 පාඩම - බොදු සිරිත් පිළිපැද වෙමු අපි සොඳුරු දරුවන්



❖ බුද්ධ චරිතයේ ආදර්ශ බොහෝ ය.

❖ බුදු සිරිතෙන් මතු කරගත් ආදර්ශ අපේ ජීවිත ගොඩනගා ගැනීමට යොදාගත හැකිය.

❖ ශිෂ්‍යයකු, ගුරුවරයකු, නායකයකු ආදී ඕනෑම කෙනෙකුට බුදුසිරිතෙන් ගතහැකි උතුම් ආදර්ශ අපමණ ය.

❖ එම උදාර ආදර්ශ අතර, බුදුරජාණන් වහන්සේගේ ආචාරශීලී බව අතිවිශිෂ්ට ය.

**❖ වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) “ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඒහි සාගතවාදිය, සඛිලය........”වශයෙන් ප්‍රකාශ කළේ,
   i. සංජය පිරිවැජියා ය.
   ii. සකුළුදායි පිරිවැජියා ය.
   iii. සෝණදණ්ඩ බමුණා ය.
   iv. පොක්ඛරසාති බමුණා ය.

2) “බොරු කීම කැතමය - ගැරඬි කුණටත් නොසමය......”මෙම කවිපද ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක්ද?
   i. සැළලිහිණි සංදේශය.
   ii. සුභාෂිතය.
   iii. සිරිත් මල්දම.
   iv. ගුත්තිල කාව්‍ය.

3) තමන් වහන්සේ විසින්ම දොර හැර බුදුරදුන් සුහදව කළ පිළිගැනීමෙන් බලවත් සතුටට පත් වූයේ,
   i. සුද්ධෝදන රජතුමා ය.
   ii. බිම්බිසාර රජතුමා ය.
   iii. උදේනි රජතුමා ය.
   iv. පසේනදී කොසොල් රජතුමා ය.

4) බුදුරජාණන් වහන්සේ ආරාම පිළිගැනීම ආරම්භ කරන ලද්දේ,
   i. මෙතෙක් වැඩ විසූ ස්ථාන සුව පහසු නොවූ නිසාවෙනි.
   ii. ආරාමයක ජීවත් වීමට ඇල්මක් දැක්වූ නිසාවෙනි.
   iii. මහජන මතයට ගරු කිරීමක් වශයෙනි.
   iv. තම සේවාව වඩාත් හොඳින් සිදුකළ හැකි නිසාවෙනි.

5) භාග්‍යවතුන් වහන්සේ මා නමින් ම අමතන සේකැයි අතිශය සතුටට පත්වූයේ,
   i. සෝණදණ්ඩ බමුණා ය.
   ii. සංජය පිරිවැජියා ය.
   iii. සුභද්‍ර පිරිවැජියා ය.
   iv. සුදත්ත සිටුතුමා ය.

❖ හිස්තැන් පුරවන්න.

6) රජගහ නුවර සීත වනයේ වැඩ සිටියදී බුදුන්වහන්සේ ව දැක ගැනීමේ බලවත් කැමැත්තෙන් රැය නිදි නොලබාම ඇවිද ආවේ ............................................................ ය.

7) බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ මේදතලුම්ප නම් නියම්ගම පිහිටි ආරාමයෙහි වැඩ සිටියදී .......................................................... රජ තෙමේ උන්වහන්සේ හමුවීමට ඒහි පැමිණියේය.

8) දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන ලෙස ශික්ෂාවක් පැනවූයේ .......................................................... ගේ ඉල්ලීමකට ගරු කිරීමක් වශයෙනි.

9) බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් .......................................................................... .අගය කළ ශාස්තෘවරයෙකි.

10) නිහතමානි යන්නෙන් අදහස් කරන්නේ .......................................................................... නැති බවයි.

❖ පහත ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.

11) බුදු සසුනේ අග්‍ර දායක තනතුරට පත් වූයේ අනේපිඬු හෙවත් සුදත්ත සිටුතුමායි. (.........)

12) බුද්ධ චරිතය තුළින් ඉස්මතු වූ ගුණාංගයක් නොවන්නේ මහජන මතයට ගරු කිරීමයි. (.........)

13) සුභද්ද බුදු සසුනේ අවසන් ශ්‍රාවකයා බවට පත්වෙමින් රහත් භාවයට පත්වූහ. (.........)

14) බුදුරජාණන් වහන්සේ නිහඬ බවට කැමති ශාස්තෘවරයෙකි. (.........)

15) සෝණදණ්ඩ අංග ජනපදයේ චම්පා නුවර සිටි බමුණෙකි. (.........)

❖ පිළිතුරු ලියන්න.

16) ගෞතමයන් වහන්සේ "අබ්භාකුටිකය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

17) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹුවන ආචාරශීලී ගුණාංග 5ක් ලියන්න.

18) බුදුරජාණන් වහන්සේ අන්මතයට ගරු කළ අවස්ථා සඳහා නිදසුන් 3ක් ලියන්න.

19) ආචාරශීලී ගති පැවතුම් අනුගමනය කිරීමෙන් අපගේ ජීවිත වලට ලැබෙන ප්‍රයෝජන 4ක් ලියන්න.

20) සිරිත් මල්දම ග්‍රන්ථයේ කතුවරයාගේ නම කුමක්ද?





**2021 - පළමු වාරය**

**බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය**

**03 පාඩම - ධර්ම රත්නයේ ගුණ**






- ❖ ධර්ම රත්නයෙහි ගුණ සයාකාර වේ .
- ❖ බුදුරදුන් විසින් ගුරු තන්හි තබා ගන්නා ලද ධර්ම රත්නයේ ගුණ නිතර මෙනෙහි කිරීම ධම්මානුස්සතියයි .
- ❖ බෝසත් දුවේ පුතේ ධර්ම රත්නයේ ගුණ මෙනෙහි කරමින් ඔබ ද ධර්මානුකූලව හැසිරෙන්න එවිට ධර්මය ඔබ රකිනු නොඅනුමාන ය
- ❖ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. අප බෝධිසත්ත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ.
    i. අවුරුදු 25 දී ය .  ii. අවුරුදු 35දී ය.  iii. අවුරුදු 36 දී ය.  iv. අවුරුදු 37 දී ය.

02. බුදුරජාණන් වහන්සේගේ පිරනිවන් පෑම සිදුවූයේ.
    i. අවුරුදු 75 දී ය.  ii. අවුරුදු 79දී ය.  iii. අවුරුදු 80 දී ය.  iv. අවුරුදු 81 දී ය.

03. බුදුපියාණන් විසින් දේශනා කරන ලද ධර්මය මුල, මැද, අග යන තුන් තැන්හි ම යහපත් වේ. එම නිසා ධර්ම රත්නය,
    i. පුරිසදම්මසාරථී නම් වේ .  iii. සත්තා නම් වේ.
    ii. ස්වාක්ඛාත නම් වේ.  iv. අකාලික නම් වේ.

04. මෙලොව දී ම දැනදැක ගත හැකි බැවින් ධර්ම රත්නය ,,
    i. උජුපටිපන්න නම් වේ .  iii. සන්දිට්ඨික නම් වේ.
    ii. ස්වාක්ඛාත නම් වේ.  iv. අකාලික නම් වේ.

05. ඕනෑම කාලයක දී ප්‍රතිඵල ලැබිය හැකි නිසා ධර්ම රත්නය,
    i. පුරිසදම්මසාරථී නම් වේ .  iii. සන්දිදිට්ඨික නම් වේ .
    ii. ස්වාක්ඛාත නම් වේ.  iv. අකාලික නම් වේ.

06. මෙසේ එව බලවැයි නිර්භය ව ප්‍රකාශ කළ හැකි නිසා ධර්මය
    i. ඒහිපස්සික නම් වේ .  iii. සත්තා නම් වේ.
    ii. ඕපනයිකෝ නම් වේ.  iv. අකාලික නම් වේ.

07. තමාගේ සියලු කටයුතු පසෙක තබා සිතට නඟා ගැනීමට සුදුසු බැවින් ධර්මය.
    i. පුරිසදම්මසාරථී නම් වේ.  iii. ඕපනයිකෝ නම් වේ.
    ii. ස්වාක්ඛාත නම් වේ.  iv. අකාලික නම් වේ.

❖ හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ලියන්න.

08. ත්‍රිවිධ රත්නයේ ගුණ ගණන.................................................................................... කි.

09. භක්ති ගීත කෘතිය රචනා කරන ලද්දේ ............................................................................ විසිනි.

10. ධර්ම රත්නයේ ගුණ ගණන ..................................................................................... කි.

11. බුදු රජාණන් වහන්සේ ................................................................. ගුරු තනතුරෙහි තබාගත් සේක.

12. බුද්ධ රත්නයේ ගුණ ගණන ............................................................... කි.

13. සංඝ රත්නයේ ගුණ ගණන.................................................................. කි.

❖ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

14. හතළිස් පස් වසරක් බුදුන් වහන්සේ සිදු කළ දේශනා හැඳින්වෙනුයේ කුමන නමකින් ද?

15. නුවණැත්තන් විසින් තම තමා ම වෙන වෙන ම අවබෝධ කර ගත යතු බැවින් ධර්ම රත්නය කුමන නමකින් හැඳින්වේ ද?


16. ධම්මානුස්සතිය යනු කුමක්දැයි ලියන්න.

17. ඒහිපස්සිකෝ ගුණය යනු කුමක්දැයි හඳුන්වන්න.

18. පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී යන්නෙහි අර්ථය ලියන්න.

19. **"කායේන ච සරණං යාමී"** යන කවිය සහ එහි අර්ථය ලියන්න.

20. ධර්ම රත්නයේ ගුණ ඔබගේ ජීවිතයට එක් කර ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් ලියන්න.



**2021 - පළමු වාරය**

**බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය**

**04 පාඩම - අපේ සිරිත් අපි සුරකිමු.**



- උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් අවස්ථාවල සිදු කරන විවිධ උත්සව පවතී .
- එහි දී බුදු දහමට අනුව විමසා බලා වඩාත් නිවැරදි දේ ඉටු කිරීමට බෞද්ධයා පුහුණු විය යුතුය .
- පාරම්පරික ව පැවති හෝ අලුතින් එකතු වූ දේ හෝ අන්ධානුකරණයෙන් අනුගමනය නොකොට බුද්ධිමත් ව කටයුතු කිරීම බෞද්ධයාගේ වගකීමකි .
- ජීවිතයේ වැදගත් අවස්ථාවලට සුරාව සූදුව සම්බන්ධ කර නොගැනීම බෞද්ධ චාරිත්‍රයයි .
- බෝසත් දුවේ පුතේ අපගේ යහපත් සිරිත් විරිත් ආරක්ෂා කර අනාගතයට එය රැගෙන යාම ඔබ සියලු දෙනාගේ යුතුකම හා වගකීම බව සිතට ගන්න.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සිරිත් යනු.
   i. නොකළ යුතුදේ ය .
   ii. නරක දෙයකි.
   iii. කළ යුතුදේ ය.
   iv. ප්‍රයෝජනවත් දෙයක් නොවේ.

02. විරිත් යනු.
   i. නොකළ යුතුදේ ය .
   ii. නරක දෙයකි.
   iii. කළ යුතුදේ ය.
   iv. ප්‍රයෝජනවත් දෙයක් නොවේ.

03. අකුරු කියවීම ඉපැරණි සම්ප්‍රදායේ හැඳින්වූයේ.
   i. බහතේරීම ලෙසයි.
   ii. නම් තැබීම ලෙසයි.
   iii. පොත් කියවීම ලෙසයි.
   iv. අත්පොත් තැබීම ලෙසයි.

04. නව නිවසක් ඉදිකොට එහි පදිංචිය ආරම්භ කිරීම.
   i. කළඑළි බැසීමේ මංගල්‍යය ලෙස හැඳින්වේ.
   ii. සරණ මංගල්‍යය නමින් හැඳින්වේ.
   iii. ඇතුළත්වීමේ මංගල්‍යය ලෙස හැඳින්වේ.
   iv. ගෘහ ප්‍රවේශ මංගල්‍යය නමින් හැඳින්වේ.

05. දස දහසක් සක්වළ බුදුරදුන්ගේ අණසක පතුරුවා පවත්වන ආරක්ෂක දේශනාව වන්නේ,
   i. පිරිත් ය. ii. මංගල කරුණු ය. iii. භාවනාව ය. iv. සීලය ය.

❖ **හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ලියන්න.**

06. මංගල අෂ්ටකවල ඇතුළත් වන්නේ ........................................................................ ගුණ ය.

07. මංගල උත්සවයක දී තැලි පිළි පැළඳවීමෙන් ........................................................ අදහස් වේ.

08. බෞද්ධ උත්සව සංවිධානයේ දී ........................................................... තොර වීම ඉතා .වැදගත් වේ.

09. අඹු සැමි ජීවිතයක ආරම්භය වන්නේ ............................................................මංගල්‍යයයි.

10. විවාහ මංගල්‍යයකට පෙර දෙපාර්ශවයේ ඥාතීන්ගේ පැමිණීම පැරණි ව්‍යවහාරයේ ........................................................................... නමින් හැඳින්වේ.

❖ **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

11. පිරිත් පින්කමක දී සිදු කරන මූලික කටයුතු පහක් ලියන්න.

12. දානයමය පින්කම දී සිදු කරන කටයුතු පහක් ලියන්න.

13. ජීවිතයේ වැගත් අවස්ථාවලට අදාළ බෞද්ධ සිරිත් විරිත් ඇතුළත් වගුවක් සකස් කරන්න.

14. අවමංගල චාරිත්‍ර පහක් ලියන්න.

15. සිරිත් විරිත් ආරක්ෂා කිරීම තුළින් බෞද්ධ දරුවකු ලෙස ඔබට ලැබෙන ප්‍රයොජන පහක් ලියන්න.








**2021 - පළමු වාරය**

**බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය**

**05 පාඩම - බුදු ගුණ සිහිකර බවුන් වඩමු.**



❖ බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙකකි.

1. සමථ භාවනාව
2. විපස්සනා භාවනාව

❖ බුද්ධානුස්සති භාවනා, සමථ භාවනාවට අයත් වූවකි.

❖ බුදුවරයෙකුගේ ලොව පහළ වීම ඉතා දුර්ලභ කරුණකි.

❖ සීල සමාධියෙන් හා ප්‍රඥාවෙන් අග්‍ර වූ අප මහා තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ බුදු ගුණ අතරින් නව අරහාදී බුදු ගුණ ලෙස වඩාත් ප්‍රකට ගුණ 9ක් ඇත.

❖ එම බුදු ගුණ ඉතා අවධියෙන් හා අවධානයෙන් යුතුව සිහි කිරීම, බුදු ගුණ හෙවත් බුද්ධානුස්සති භාවනාවෙන් සිදු වේ.

❖ බුදු ගුණ භාවනාවේ යෙදෙන්නාට උදාවන ප්‍රතිඵල බොහොමයකි.

❖ බුදු ගුණ භාවනාව වැඩීමට අපත් හුරු වෙමු.

❖ **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) "ඉතිපි සෝ" පාඨයේ සඳහන් බුදු ගුණ සංඛ්‍යාව,
   i. 6 කි. ii. 7 කි. iii. 8 කි. iv. 9 කි.

2) බුදු ගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව වන්නේ,
   i. බුද්ධානුස්සති භාවනාව යි.
   ii. මෛත්‍රී භාවනාව යි.
   iii. සමථ භාවනාව යි.
   iv. විපස්සනා භාවනාව යි.

3) බුදුරජාණන් වහන්සේ උතුම් චතුරාර්ය සත්‍ය ගුරු උපදේශ නැතිව ම තමාගේ නුවණින් ම අවබෝධ කොට ගත් නිසා
   i. අරහං නම් වන සේක.
   ii. සම්මා සම්බුද්ධ නම් වන සේක.
   iii. ලෝකවිදූ නම් වන සේක.
   iv. සුගත නම් වන සේක.

4) බුදු ගුණ භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵලයක් නොවන්නේ,
   i. පවට බියක් හා ලැජ්ජාවක් ඇති වීම.
   ii. කුසලයට සිත යොමු වීම.
   iii. සිතේ දරුණු ගතිය ඇති වීම.
   iv. බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව නිවැරදි පැහැදීමක් සිතේ ඇති වීම.

5) ඡත්ත නම් තරුණයාට බුදුරජාණන් වහන්සේ ඉගැන් වූ ගාථාවල ඇතුළත් වන්නේ,
   i. තෙරුවන් ගුණ ය. ii. දහම් ගුණ ය. iii. සඟ ගුණ ය. iv. බුදු ගුණ ය.

❖ හිස්තැන් පුරවන්න.

6) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද ගණන ................................................................................. කි.

7) භාවනාව වැඩීමට සූදානම් වීමේ දී පිරිමි පාර්ශවය ............................................................ පර්යංකයෙන් ද හිඳගත යුතු ය.

8) බුදුගුණ සිහි කරමින් බුදුරුව දැක, තම මරණාසන්න මොහොතේ දී සිත සනසා ගත්තේ ............................................................ සිටු පුත්‍රයා ය.

9) නව අරහාදී බුදු ගුණ ඇතුළත් පාඨය වන්නේ ............................................................ පාඨය යි.

10) ඡත්තමානවක ගාථාවල පළමු ගාථාවෙහි අඩංගු වන්නේ ................................................ ගුණය.

❖ කෙටි පිළිතුරු ලියන්න.

11) තෙරුවන් නම් කරන්න?

12) බුදු ගුණ සිහි කරමින් කරනු ලබන භාවනාව කුමක් ද?

13) අරහාදී බුදු ගුණ අතරින් පළමු බුදු ගුණය නම් කරන්න.

14) ඡත්ත නම් තරුණයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ ගුරුවරයාගේ නම ලියන්න.

15) මට්ටකුණ්ඩලී මරණින් මතු දෙව්ලොව ඉපදීමට බලපෑ කරුණ කුමක් ද?

16) බුදු ගුණ භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංස 03ක් නම් කරන්න.

17) “අරහං” බුදු ගුණය විස්තර කරන්න.

18) “නෙත සැනසිල්ල බුදු හිමි රුව දැකීමය” යන කවිය සම්පූර්ණ කරන්න.

19) බුද්ධානුස්සති භාවනාව වඩන අකාරය සරල ව ලියා දක්වන්න.

20) ඡත්ත නම් තරුණයාට බුදුරජාණන් වහන්සේ පිහිට වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

21) මට්ටකුණ්ඩලී දෙව් ලොව ඉපදීමට තරම් වාසනාවන්ත වූයේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

22) බුදුරජාණන් වහන්සේ තුළ තිබූ උසස් ගුණාංග පිළිබඳ ව පැහැදීමෙන් කතා කළ අන්‍ය ආගමිකයින් තුන්දෙනෙකුගේ නම් ලියන්න.

23) භාවනාවකට යොමු වීමේ දී දෙඅත් තබා ගන්නේ කෙසේ දැයි පෙන්වා දෙන්න.

24) ඔබ දන්නා වෙනත් භාවනා වර්ග තුනක් නම් කරන්න.

25) භාවනා කිරීමේ දී පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් වාඩි විය යුතු ආකාරය දැක්වෙන ඉරියව් දෙක රූප සටහනකින් දක්වන්න.



**2021 - පළමු වාරය**

**බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය**

**06 පාඩම - අගසව් දෙනමගෙන් උගනිමු.**



❖ බුදු සසුනේ අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනම බවට පත් වූයේ සැරියුත් මහ රහතන් වහන්සේ හා මුගලන් මහ රහතන් වහන්සේ ය.

❖ උන්වහන්සේලාගේ තොරතුරු මෙසේ ය.

| | | සැරියුත් මහ රහතන් වහන්සේ | මුගලන් මහ රහතන් වහන්සේ |
|---|---|---|---|
| 1. | දෙමාපියන් | මහාසාර බමුණු කුලයේ සාරි නම් බැමිණිය හා එම බමුණා | මහාසාර බමුණු කුලයේ මොග්ගල්ලාන බැමිණිය හා එම බමුණා |
| 2. | උපන් ගම | දඹදිව රජගහ නුවර උපතිස්ස නම් බමුණුගම | උපතිස්ස බමුණු ග්‍රාමය ආසන්නයේ පිහිටි ගමක |
| 3. | ගිහි කළ නාමය | උපතිස්ස | කෝලිත |
| 4. | පැවිදි වූ ආකාරය | අස්සජි මහ රහතන් වහන්සේගෙන් බුදු දහම දැන | තම අඹ යාහළුවා වූ උපතිස්ස පිරිවැජියා මගින් බුදු දහම පිළිබඳ ව දැනගෙන |
| 5. | පැවිදි නාමය | සාරිපුත්ත හෙවත් සැරියුත් නමින් (සාරි බැමිණියගේ පුතා බැවින්) | මොග්ගල්ලාන හෙවත් මුගලන් යන නමින් (මොග්ගල්ලාන බැමිණියගේ පුතා බැවින්) |
| 6. | රහත් භාවයට පත් වූයේ | රජගහ නුවර සූකරඛත ලෙනේ දී බුදුරජාණන් වහන්සේ විසින් සැරියුත් තෙරුන්ගේ බෑණාට දේශනා කළ වේදනා පරිග්‍රහ සූත්‍රය අසා | උපතිස්ස පිරිවැජියාට අස්සජි මහ රහතන් වහන්සේ දේශනා කළ දහම් කරුණු අසා සෝවාන් වූ අතර කෙටි කලකදී රහත් විය. |
| 7 | ලද තනතුරු | • දකුණත් සව් අග තනතුර<br>• ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග තනතුර<br>• ධර්ම සේනාධිපති තනතුර | • වමත් සව් අග තනතුර<br>• ඍද්ධිමත් භික්ෂූන් අතර අග නතතුර |
| 8 | කළ සේවාවන් හා විශිෂ්ට ගුණාංග | • තම ගුරුවරයාට හොඳින් ගරු කිරීම.<br>• ඉතා නිහතමානී ගුණයෙන් යුතු වීම.<br>• දෙව්දත් තෙර නිසා නොමඟට ගිය භික්ෂූන් යහමගට ගැනීම.<br>• වැරදි පිළිවෙත් අනුගමනය කළ තම මව නිවැරදි මාර්ගයට ගැනීම. | • දෙව්දත් තෙරුන් නිසා නොමඟට ගිය භික්ෂූන් සුමගට ගැනීම.<br>• මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරු බවින් මුදාලීම.<br>• නන්දෝපනන්ද නාග රාජයා දමනය කිරීම.<br>• මිනිස් ලොව ගැන දෙව්ලොව සැප පිළිබඳ ව හා නිරයේ දුක පිළිබඳ ව මිනිසුන් දැනුවත් කර යහමඟට ගැනීම. |
| 9 | පිරිනිවන් පෑම | සැරියුත් හිමි පිරිනිවන් පෑමට ආසන්නව තම මව්තුමියට දහම් දෙසා අවසානයේ එදිනම පිරිනිවන් පෑ සේක. | • සොරුන්ගේ තදබල පහර කෑමකට ලක් ව කාලසීමාවේ දී |

❖ **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) මොග්ගල්ලාන බැමිණියගේ පුතා වූයේ,
   i. උපතිස්ස යි. ii. කෝලිත යි. iii. සංජය යි. iv. සුනිත ය.
2) "**යේ ධම්මා - හේතුප්පභවා**" යන ගාථාව දේශනා කළේ,
   i. අස්සජි මහ රහතන් වහන්සේ ය. iii. සැරියුත් මහ රහතන් වහන්සේ ය.
   ii. මුගලන් මහ රහතන් වහන්සේ ය. iv. බුදුරජාණන් වහන්සේ ය.
3) තම ගුරුවරයා සිටි දිශාවට දිනකට තෙවරක් නමස්කාර කරන ලද්දේ,
   i. අස්සජි මහ රහතන් වහන්සේ ය. iii. සැරියුත් මහ රහතන් වහන්සේ ය.
   ii. මුගලන් මහ රහතන් වහන්සේ ය. iv. කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ ය.
4) මුගලන් මහ රහතන් වහන්සේ ලද අග තනතුරකි.
   i. ඍද්ධිමතුන් අතර අග තනතුර iii. ධුතාංගධාරීන් අතර අග තනතුර
   ii. ප්‍රඥාවන්තයන් අතර අග තනතුර iv. ප්‍රත්‍යලාභීන් අතර අග තනතුර

❖ **පහත ප්‍රකාශ හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

5) උපතිස්ස හා කෝලිත යන දෙදෙනාගේ පළමු ගුරුවරයා සංජය පිරිවැජියා ය. (...........)
6) අස්සජි මහ රහතන් වහන්සේ ව පළමුව මුණ ගැසුණේ කෝලිත පිරිවැජියා ට යි. (...........)
7) බුදුරජාණන් වහන්සේ විසින් දීඝනඛ නම් පිරිවැජියාට දේශනා කළ වේදනා පරිග්‍රහ සූත්‍රය අසා මුගලන් තෙරණුවෝ රහත් වූහ. (...........)
8) ප්‍රථම සංඝ සන්නිපාතය සිදු වූයේ නවම් පොහෝ දිනක දීය. (...........)
9) ධර්ම සේනාධිපති තනතුර ලැබුණේ සැරියුත් මහ රහතන් වහන්සේට ය. (...........)
10) මච්ජරිය කෝසිය සිටු තුමා මසුරුකමින් මුදවා ගත්තේ මුගලන් මහරහතන් වහන්සේ ය. (...........)

❖ **කෙටි පිළිතුරු ලියන්න.**

11) සැරියුත් මහරහතන් වහන්සේගේ ගිහි නාමය කුමක් ද?
12) උපතිස්ස කෝලිත දෙදෙනාට ජීවිතයේ නිරර්ථක බව දැණුනේ කුමක් නැරඹීමෙන් පසුව ද?
13) "යේ ධම්මා - හේතුප්පභවා" යන ගාථාව සම්පූර්ණ කරන්න.
14) එහි සරල අදහස ලියන්න.
15) සැරියුත් මහරහතන් වහන්සේ ලද අග තනතුරු දෙකක් නම් කරන්න.
16) මුගලන් මහරහතන් වහන්සේගෙන් වූ සේවාවන් දෙකක් ලියන්න.
17) සැරියුත් හිමියන්ගේ "නිහතමානී ගුණය" සඳහා උදාහරණයක් දෙන්න.
18) අගසව් චරිත දෙකෙන් අප ලබාගත හැකි ජීවිතාදර්ශ හතරක් ලියන්න.
19) අග්‍රමහා ශ්‍රාවකයන් වහන්සේලා පිළිබඳ ව ළමා පුවත්පතකට ලිපියක් ලියන්න.
20) මුගලන් මහරහතන් වහන්සේ සොරුන් අතින් මරණයට පත්වීමට බලපෑ හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.